වැදි ජනයාගේ (වන්නියලැත්තන්ගේ)

# පාරිසරික ආකල්පය

**වැ**දි ජනතාවගේ සංස්කෘතියේ ගතයුතු මූලික හරයන් කුමක් දැයි සොයා බැලුවහොත් ඒ සඳහා කරුණු තුනක් පෙන්වා දිය හැකි ය. ස්වයංපෝෂිත භාවය, සරලත්වය හා පරිසරය සමග සහජීවනය වශයෙන් මෙම කරුණු සළකා ගත හැකි ය. වෙන වෙන ම දක්වන ලද නමුත් මේ කරුණු එකිනෙකට සම්බන්ධය. වසර දහස් ගණනක් තිස්සේ නොනැසී පැවතීමටත් අද දක්වා ම ප්‍රාථමික ජන කොටසක් වශයෙන් පැවතීමටත් හේතු වූයේ ද මෙම කරුණුම ය.

මෙම කරුණු පිළිබඳව සළකා බලන කළ වැදි ජනතාව කෙලින් ම පාරිසරික ජීවීන් ලෙස වෙනත් අයුරකින් කිවහොත් ස්වභාවධර්මයේ ජීව චක්‍රයට පටහැනි නොවන ජනකොටසක් ලෙස හැඳින්විය හැකිය. එම තත්ත්වය පවතින්නේ ඔවුන්ගේ සංස්කෘතියේ පෙර සඳහන් මූලික කරුණු තුන රැඳී පවතිනතාක් කල් පමණි.

සෑම සත්වයෙකුටම තමාට ප්‍රමාණවත් ප්‍රමාණයකට පාරිසරික සම්පත් භුක්ති විඳීමේ අයිතියක් ඇත. තමාට වුවමනා සම්පත් අනුන් ලවා රැස් කරවා ගැනීම හෝ තමාට නොසෑහෙන සම්පත් රැස්කර තබා ගැනීම හෝ උදුරා ගැනීමට කිසිදු සත්ව යෙකුට අයිතියක් නැත. මේ ලෝක නීතිය උල්ලංඝනය කළ එකම සත්වයා මිනිසා ය. ඔහුට එය කළ හැකි වූයේ සිය දියුණු මනස මෙහෙයවා කටයුතු කිරීමෙනි. එහෙයින් තාමත් ආදී කාලීන ජන සමාජවල ලෝක නීතියට අනුව හැඩගැසුණු පිළිවෙලක් දක්නට ලැබේ.

වැදි ජනතාව කිසි විටෙකත් සිය වුවමනාවන් සඳහා වෙනත් අයෙකු කෙරෙහි විශ්වාසය නොතැබූහ. තමන්ට බඩගිනි දැනෙන විට ඒ සඳහා තමාම වෙහෙසිය යුතු විය. බොහෝ විට වර්තමානයේ බොහෝ පාරිසරික ගැටලුවලට හේතු වී ඇත්තේ සම්පත් රැස්කිරීම සඳහා යොදා ගනු ලබන උපක්‍රම වල අනිසි ප්‍රතිඵලයන් ය. වැදි ජනතාව මූලික වශයෙන් සිදු කරන ලද දඩයම පිළිබඳව සලකා බැලුවහොත් ඔවුන් ඒ සඳහා යොදා ගනු ලැබූ උපක්‍රම නිසා පරිසරයට වෙනත් අයුරක හානියක් නොවීය. ඒ සඳහා යොදාගත් දුන්න හා ඊතලය තුවක්කුවකට වඩා බෙහෙවින්ම නොදියුණු තත්ත්වයේ එකක් වූවත් තුවක්කුවෙන් නැගෙන හඬ නිසාත් එයින් පිටවන ගින්න හා විෂ ද්‍රව්‍ය නිසා පරිසරයට සිදුවන හානි කිසිවක් දුන්න භාවිත කිරීමෙන් සිදු නොවීය. කුඩා සතුන් මරා ගැනීම සඳහා යොදන අනෙක් උපක්‍රම රාශියකි. හබක, උගුල, තඩිය, ලූල, මන්ද, තොන්ඩුව, ලැබ වැනි උපක්‍රම පරිසරයේ ම ඇති යම් යම් දේ ප්‍රයෝජනයට ගෙන සතුන් අල්ලා ගැනීම සඳහා යොදා ගනු ලැබේ. මේ ක්‍රම කිසිවකින් පරිසරයට අනිසි හානියක් සිදු නොවේ.

දඹානේ ගුණවර්ධන

වැදි ජනතාවගේ අවශ්‍යතා ඉතා සීමාසහිත ය. කෑමබීම ඇඳුම හා නිවහන වැනි මූලික අවශ්‍යතා වලින් පමණක් ඔවුන්ට සෑහීමට පත්විය හැකිව තිබිණි. එමෙන් ම අනාගතය සඳහා සම්පත් රැස්කර තබා ගැනීමේ පුරුද්දක් ද නොවීය. ඒ නිසා ම ඔවුන් ගේ ජීවිත සරල ය. තෘප්තිමත් ය. සරල ජීවිතයක් ගත කළ ඔවුන්ට පාරිසරික සම්පත් විනාශකර දැමීමේ වුවමනාවක් නොවීය.

වැදි ජනයාට පරිසරය විසින් නිර්මානය කරනු ලබන හොඳ හෝ නරක ප්‍රවණතාවයන්ට අනුකූලව හැඩ ගැසීමේ හැකියාව තිබිණි. දියුණු මිනිසා තමා ගේ සුවපහසුව සඳහා පාරිසරික සාධක වෙනස්



කිරීමට ගත් උත්සාහය අපමණ ය. දියුණු සමාජය එක් අතකින් වැදි ජනතාව නොදියුණු යැයි සලකන්නේ ඔවුන් තම වුවමනාවන් සඳහා පරිසරය වෙනස් කිරීමට නොදන්නා හෙයිනි. එහෙත් දියුණු මිනිසා ගනු ලබන මෙම උත්සාහය ස්වභාවධර්මය විසින් මවන ලද ජීව චක්‍රයට පටහැනි බව තවමත් හරිහැටි වටහාගෙන නැත. ඒ අතින් නොදියුණු වුවත් වැදි ජනතාව පරිසරය සමග යහපත් සහජීවනයක් පවත්වා ගන්නට සමත් වූහ. එහි ප්‍රතිඵලය වශයෙන් වැදි සමාජය අවුරුදු දහස් ගණනක් අඛණ්ඩව පැවැති අා නමුත් දියුණු යැයි සම්මත පරිසරයට එරෙහිව කටයුතු කරන සමාජයේ ඉදිරි පැවැත්ම ඉතා ඉක්මණින් අවසන් වනවාට කිසිදු සැකයක් නැත.

භාෂාවෙන් හෙළිවන අනෙක් වැදගත් කරුණ නම් වැදි ජනතාව ජීව සංහතිය කෙරෙහි දැක් වූ සමානාත්මතාවයි. තමන් හඳුනා ගන්නට "මේ ඇත්තෝ" කියා යොදන අතර අනෙක් සියලුම ජීවී නාම අගින් "ඇත්තෝ" යන්න භාවිත කරයි. උදාහරණ වශයෙන් අම්මල ඇත්තෝ (අම්මා) අප්පිල ඇත්තෝ (තාත්තා) බොටකදාල ඇත්තෝ (අලියා) පොල්ලැව්වලා ඇත්තෝ (කොටියා) ඔප්පිල ඇත්තෝ (කුරුල්ලා) ආදී වශයෙන් පණ ඇති සියලු දෙනාම තමන් හා සමාන යන අරුතකින් එකම පදයෙන් හඳුන්වනු ලැබේ. මිනිස් සමාජයේ වුවද විවිධ තරාතිරම් ඇතත් වැදි සමාජයේ එවැන්නක් නොවීය. සියලුම පිරිමින් හැඳින්වීමට 'හූරා' යන පදය යෙදිය



කැළෑව අසලම නිවාස තැනීම වැදි ජනයාගේ සම්මත පිළිවෙළයි.

හැකි අතර සියලුම ගැහැණුන් හැඳින්වීමට 'නැනී' යන පදය යොදනු ලැබේ.

වැදි ජනතාවගේ සංස්කෘතික අංගයන් තුළ ගැබ්ව ඇත්තේ පරිසරය සමග ජීවත් වූ ඔවුන්ගේ ජීවන රිද්මයයි. කවර ජන සමාජයක වුවත් භාෂාවක් හටගන්නේ එකිනෙකාගේ සිතුම් පැතුම් අන්‍යයන්ට ප්‍රකාශ කිරීමට ගන්නා උත්සාහය මතයි. වැදි භාෂාව පිළිබඳව කරුණු සොයා බලන්නෙකුට හඳුනාගත හැකි වන මූලික කරුණ එම භාෂාව වචන සුළු ප්‍රමාණයකින් සැදුණු කුඩා භාෂාවක් බවයි. මෙයින් එළඹිය හැකි නිගමනය වන්නේ වැදි ජනතාවගේ සරලත්වයයි. එදිනෙදා හමුවන ගහකොළ හා සතුන්ට වෙන වෙනම නම් භාවිතා වන අතර ජීවිතය හා සම්බන්ධ ක්‍රියා පදයන් කිපයක් පමණක් භාෂාව වශයෙන් අනාදිමත් කාලයක් භාවිත කොට තිබීමෙන් ම ඔවුන්ගේ ජීවිත කොතරම් සරල වූයේ ද යන්න දෙස් දෙයි.

වැදි ජනයාගේ ඇදහිලි හා විශ්වාස පිළිබඳව සළකා බලන විට ඒ තුළ ගැබ් වූ විශාල පාරිසරික දෘෂ්ටියක් ඇති බව පෙනේ. තමාට හොඳ හෝ නරක ප්‍රතිඵල උදාවන්නේ තමාට පෙනෙන ගහකොළ, ගංගා, අහස පොළොව, ඉර, හඳ, කඳු කැලෑ ආදියෙහි ඇති යම් අදෘශ්‍යමාන බලවේගයක් විසිනැයි ඔවුහු විශ්වාස කළහ. තමාට නොපෙනනා වූ එම බලවේගය යකුන් හෝ දෙවියන් වශයෙන් ඔවුහු අඳුනා ගත්හ. ඒ අනුව තමාට හොඳ හෝ නරක සිදු කරනු ලබන්නේ කැළෑවට කඳුවලට ඉරට හඳට ආරූඪ වී සිටින යම් දේවතාවෙකු විසිනැයි ඔවුහු විශ්වාස කළහ. ඒ අනුව ඒවාට වැඳුම් පිදුම් පුද සත්කාර ආදිය කළහ.

යකුන් වශයෙන් තමාට නොපෙනෙන නමුත් ජීව මානව වැඩ වසන යම් පිරිසක් ඇති බව ඔවුන් ඇදහූ නමුත් ඒ සඳහා යොදා ගත් නම් තමා අවට ඇති වස්තු වල නම්මය. උදාහරණ වශයෙන් ඉර දෙයියෝ, හඳ දෙයියෝ, මාවරගල යකා, කොක්කා ගල යකා, කෙහෙල් පොත ගල යකා, නාගහ යක්කු, බෝගහ යක්කු, දෙමටං ඇල්ලේ සේනාව, දෙමටං දිගිලියේ සේනාව, ඇල්ගිගිරං බණ්ඩාර, ඔමරිකන්දෙ සේනාව, ගගේ බණ්ඩාර වැනි නම් භාවිතා කිරීමෙන් පෙනී යන්නේ යකුන් ලෙස පුද පෙත් කරනුයේ එම ස්වභාව වස්තූන්හී තමන්ගේ ජීවිතයට සම්බන්ධව ක්‍රියාත්මක වන අදෘශ්‍යමාන බලවේගයට බවයි. එම බලවේගය පැහැදිලිවම හඳුනා ගත නොහකි බැවින් ඊට දේවත්වයක් ආරෝපනය කොට පුදපෙත් කිරීමෙන් සෙතක් සලසා ගන්නට වෑයම් කළ හ. වෙනත් අයුරකින් කිවහොත් තම යහපත සඳහා ස්වභාව ධර්මයේ ක්‍රියාත්මක වන බලවේග කඩා බිඳ දැමීම වෙනුවට යටහත් සිතින් පුදපෙත් කිරීමෙන් සිය යහපත උදාකර ගැනීම අරමුණු කරගත්හ.

වැදි ජනයාගේ ආකල්ප අතර ඇති තවත් වැදගත් කමක් නම් අනාගතයට වඩා අතීතය සමග සම්බන්ධකම් තිබීමයි. ඔවුහු තමන් අතරින් මිය යන පුද්ගල-යකු යළිත් අදෘශ්‍යමානව තමා අතරටම එන්නේ යැයි විශ්වාස කරති. ඔවුන් නෑ යක් ආත්මය ලබා මුලින් ම තම ඥාතීන් අතරට එන්නේ 'අහස මහපොලෝ ඉර හඳ දෙයියන්නෙන්' වරම් ගෙන ය. ඔවුන්ගේ නම් ද බොහෝ විට 'නාමල් කුමාරී, සඳුන් මල් කුමාරී, නාගහේ දේවතාවී' වැනි ගහකොළට සම්බන්ධ නම් ය. ඥාතීන් අතරට එන අලුත් නෑ යකා වාසය සඳහා තෝරා ගන්නේ කොක්කාගල, බනකිරිගල වැනි කඳු සහිත කැලෑවකි. පරම්පරා ගණනක් එම වන බිම් ඇසුරෙහි වැඩ වසන ඉදිගොල්ලේ කිරි අම්මා වැනි යක් සේනාවකට ඔවුන් එක්වේ.

මෙම ඇදහිල්ලෙන් හෙළිවන ඉතා වැදගත් කරුණක් ඇත. එනම් වැද්දා වන බිම සිය තාවකාලික වාස භූමිය පමණක් බව නොසිතීමයි. වනයම සිය ආදී මුතුන් මිත්තන් වෙසෙන්නාවූත් තමන් ජීවත් වන්නාවූත් මරණින් මතුව තමන්ට වෙසෙන්න සිදු වන්නාවූත් සදාකාලික වාස භූමියක් ලෙස වැද්දෝ සැළකූ හ. ඒ නිසා ම එය වනසා දැමීම ඔවුන්ගේ ප්‍රතිපත්තිය නොවීය. විශේෂයෙන් ම ඇලි ආශ්‍රිත කැලෑ හා කඳු ආශ්‍රිත කැලෑ කවර හේතුවක් නිසාවත් හෙළි නොකළේ ඒවාහී අනිවාර්යයෙන් ම යකුන් වැඩවසන බැවිනි.

වැද් ජනයා සිය ඕනෑ එපාකම් සියල්ලම සඳහා විශ්වාසය තැබුවේ මහ වනය කෙරෙහි ය. එහි වෙසෙන්නේ යැයි සැළකූ යකුන් කෙරෙහි ය. දුකක් දොම්නසක් පැමිණි හැම විටකදීම කැලෑවට අදිගෘහිත යකුන්ට කන්නලව් කොට ශාන්තිය සළසා ගත්හ. වනයට ඇතුළු වන හැම විටකම ලොකු ගසක අත්තක් එල්ලා ආරක්ෂාව පැතූ හ. දඩයම් නොලැබෙන විටක අතුකොළ මත දුනුහී තබා යකුන් යැද්දාහ. එමෙන් ම ආහාරයට යමක් ලැබුණු හැම විටකම අතුකොළ මත තබා එහි මුල් කොටස යකුන්ට පිදීමට අමතක නොකළහ.



*වනසතුන්ගෙන් හේන ආරක්ෂාකරගැනීම සඳහා සාදා ඇති පැලක්*

මූලිකව පැවති අභිචාර ක්‍රම වඩා වර්ධනය වෙමින් පවතින ලද නමුත් එහි පරිසරය හා සම්බන්ධ වූ මූලික අංග තාමත් දැකගත හැකි ය. මුල්ම යුගවල දී වැදි ජනයා අතර පැවති ආවේණික තොවිල් ක්‍රමය වූ 'බැදියකුම' සිදු කළේ මහ කැලෑව තුළ දී ය. වර්තමානයේ වුවත් යක් මඩුවට යකුන් පැමිණෙන බව සංකේතවත් කරනු ලබන්නේ යක් මඩුවෙහි (යකුන් සඳහා සැකසූ සැරසිල්ලේ) අතු එල්ලීමෙනි. 'කොළමඩුව' නැමති යක් ගෙය සම්පූර්ණයෙන් ම කැලෑවක ආකෘතියකි. තොවිල් ක්‍රම වල දී ආතුරයා සුවපත් කිරීම සඳහා කරනු

ලබන්නේ නා අතු මිටියකින් ආතුරයාගේ සිරුර පිස දැමීමයි. නොඑසේ නම් පවන් සැලීමයි. එයින් අදත් වැදි සමාජයේ ඇත්තෝ සත්තකින්ම සුවය ලබති. පරිසරය කෙරෙහි පවතින බැඳීම නොකැඩෙන තාක් එහි පුදුමයක් ද නැත. ලෙඩදුක් අනතුරු ආරක්ෂාව අඩයම් ලබාගැනීම පමණක් නොව තමාට හතුරුකම් කරන හතුරාට දඬුවම් ලබාදෙන්නේ ද යකුන්ට කන්නලව් කිරීමෙනි.

බීජ අස්වනු බවට පත්වන්නේ අහසේත් පොළවේත් පවතින යම් බලවේගයක ප්‍රතිඵල නිසා බව දන්නා හෙයිනි. අස්වනු නෙලා එහි මුල් කොටස තමාට උපකාර කළ යකුන්ට පුදන්නට වැද්දෝ අමතක නොකළහ. එමෙන් ම හේනේ ආරක්ෂාව සළසා ගන්නා ලද්දේ ද අතු එල්ලා යකුන්ට භාර කිරීමෙනි.



වැදි නායක නිසාහාමිගේ අත්කම් කිහිපයක්

වැදි ජනතාව පසුකාලීනව හේන් වගාවට හුරු වූ විට අනුගමනය කළ බොහෝ පිළිවෙත් වලද දක්නට ලැබෙන්නේ පරිසරය සමග ඔවුන් ගත කළ සහජීවන යෙහි ලකුණු ය. ඔවුන් හේන් කැපීම ආරම්භ කරන්නට පෙර ආයුධ බිම තබා කැලෑවට නමස්කාර කොට සමාව ගැනීම සිරිතකි. කැලෑවට අවහිරයක් නොවන පරිදි සැළසුම් ගතව කපන ලද කුඩා හේනට ගිනි තැබීමට පෙර හේන වටා පාරවල් පිරා සකස් කරන්නේ ගින්දර පිට කැලෑවට යෑම වැළැක්වීම සඳහා ය. ගිනිහුල අතට ගන්නා වැද්දා සිය හේනට එක් වරම ගිනි තබන්නේ නැත. හේන වටා කීප වටයක් ඇවිදිමින් 'මා අතර වරද නැතෝ, කනෝ කොරෝ අන්ධයෝ භූතයෝ පලෝ, හූ හූ' කියමින් කීප වරක් හූ කියන්නේ ඒ හඬ අසා හේනේ ඇති කුඩා සතුන් පිටවී යන බව විශ්වාසකරන හෙයිනි. මුලින් ම තමා අත වරද නැතැයි කියන්නේ නිකරුනේ කුඩා සතුන් පුළුස්සා දැමීම වරදක් සේ සැළකූ හෙයිනි.

හේන ගිනිතබා බිජුවට වපුරන්නට පෙර අහසටත් පොළවටත් වැඳ නමස්කාර කරන්නේ තමන් වපුරන

වැදි ජන සමාජයේ කලා නිර්මාණ වශයෙන් අපට හමුවන වැදි ගී බොහෝමයක ඇත්තේ ද ඔවුන් පරිසරය හා සහජීවනයෙන් බැඳී ගතකළ ජීවිතයේ ලැබූ තෘප්තියයි. කෘතිමව සකසන ලද වටපිටාවකට වඩා ස්වාභාවික පරිසරය විසින් මවන ලද සුන්දරත්වය වැද්දා කෙතරම් ග්‍රහනය කරගත්තේ ද යන්න මනාව පැහැදිලි කෙරෙන ගියක් වැදි සමාජයේ ඇත. යොවුන් වියේ පසුවන අඹුසැමි යුවලක් උදැසන වටපිටාවෙන් මතුවන සුන්දරත්වය දකින ආකාරය මේ ගී පද වලින් මනාව කියවේ. ඒ ගී පද මෙසේ ය.

*"එලිවිල පං විල වෙන්නම් නැනෝ
යන්නට නිදි කිඹිදිය කිරි නැනෝ
වජ්ජි වලි බිලි කීයන කලට
වටවල කන්දට ඉපිරි පිටෙන්
වෙල්ලං ඉර කෙඳි පිදෙන්නා
විදි ඉර කෙඳි පායන කලට
එලවැල් කිරි වැල් මල් පිපිලා
කනමෙයි කෝතොයි අඬන කලට
යන්නට නිදි කිඹිදියය කිරි නැනෝ*



මෙයින් කියවෙන අරුත මෙයයි. "සොඳුර දැන් එළි වී පහන් වෙයි. කැලේ යන්නට අවදි වෙන්න. කුරුල්ලන්ගේ මිහිරි නාදය අවට්න් ඇසෙයි. අන්න වටවල කන්දට ඉහළින් දඟකාර ලෙස හිරු රැස් විහිදෙනවා. හිරු රැස් විහිදමින් ඉර පායන වේලාවට කැලෑවේ එලවැල් වලත්, කිරි වැල් වලත් මල් පූදිනවා. ඒ මොහොතට මල් රොන් ගන්නට එන කනමේ මැස්සොත් කෝන මැස්සොත් නාද කරනවා. කැලේ යන්නට හොඳම වේලාව ඒයයි. තව මොහොතකින් ඒ වෙලාව උදාවෙයි. ඒහෙයින් සොඳුර අවදි වන්න." හිරු නැඟී එන්ම පරිසරයේ මතුවන සුන්දරත්වය මේ ගීයෙන් කියවෙන්නේ මනසේ චිත්ත රූපයක් ඇඳී යන අයුරිනි. ඒ ඔවුන්ගේ හදවත් තුළ සදාකාලිකවම පරිසරය කෙරෙහි වූ ආදරයක් පරිසරය පෑ සුන්දරත්වයත් තැන්පත් වී තිබෙන හෙයිනි.

මේ ආකාරයෙන් සළකා බලන කළ නොදියුණු පරපුරක් ලෙස දියුණු යැයි සම්මත ජන සමාජය විසින් ඉවතලා තිබෙන වැදි සමාජයේ ගත යුතු හරයන් කොතෙක් තිබේදැයි වටහා ගැනීමට පුළුවන. ලෝක නීතියට පටහැනි නොවුණු සාධාරණ මිනිස් කොටසක් ලෙස පමණක් නොව වත්මන් සමාජයට ගුරුපදේශ ගත හැකි තරමේ සංස්කෘතියක් තිබෙන පිරිසක් ලෙස වැද්දන් සැළකීමේ වරදක් නැත. වර්තමානයේ සමාජ ප්‍රවණතා හමුවේ අසරණ වී සිටින වැදි ජනයා පුනරුත්ථාපනය කරන්නේ නම් එය කළ යුත්තේ ද මුලින් කී ස්වයංපෝෂිත බව, සරලත්වය හා පරිසරය සමඟ සහජීවනය යන මූලික අංග තුන සුරකෙන පරිදි ය. එසේ වුවහොත් තමා අනාදිමත් කාලයක් වැදි ජනතාවට පරිසරය සමඟ සහජීවනයෙන් ජීවත් වන්නට හැකිවනු ඇත.



**ගුණවර්ධන** දඹානේ වැදි නායක ඌරු වරිගේ තිසාහාමිගේ මුණුබුරෙකි. වැදි ජනතාව අතර සිටින උසස් අධ්‍යාපනයක් ලැබූ තරුණයෙකු වන මොහු උපාධි අපේක්ෂකයෙකි. වන්නියේ-ඇත්තන්ගේ සංවිධානය මගින් වන්නියේ-ඇත්තන්ගේ සුබ සිද්ධිය සඳහා විශාල කාර්ය භාරයක් ඉටු කිරීමේ වගකීම ඔහු වෙත පැවරී ඇත.